

# ACCEPTANCE

Australia is blessed to be a democratic multicultural society, where people that come from different background can live peacefully alongside each other and are able to have an equal say in how the country should be governed. However, recently this harmony has been challenged. Not just in Australia but all around the world, people are turning their back on those who may be living their differently and believe in different gods. No matter what our skin color is, or who we pray to, we are all humans who desire to live a happy and fulfilling where we feel safe and are accepted, that is just the human condition.




Australia has been at the forefront of promoting multiculturalism, where regardless of background, each person has an equal right to project their voice. We are a democratic country where there is no discrimination on who can vote and who can't, this is important as it means that everyone over the age of 18 can have a say on who they want to lead the country and who they would allow to make laws which they are bound by. Furthermore, the Australian government passed the 'Racial Discrimination Act' which works to "ensure that Australians of all backgrounds are treated equally and have the same opportunities" (Australian Human rights Commission). This act aims to make sure that everyone in the community has equal rights is all fields (e.g. education and work) and are not discriminated on the basis of their skin color or country of origin. As we can see, Australia has continuously worked to preserve the countries unity and freedom, where everyone feels that they are at home, no matter where their journey started. As a person of color, I can say that I have never been held back or stopped from doing something because of my cultural roots.

However, this feeling of acceptance in all countries, has been inhibited due to increased amounts of racial profiling. More and more people around the world are becoming xenophobic, and more specifically there has been a worldwide spread of Islamophobia. The definition of Islamophobia is the "dislike of or prejudice against Islam or Muslims". What drives people to not like an individual purely based on their cultural background? The answer is that they are guilty of generalization. One of the biggest terrorist groups in the 21st century is ISIS who are an Islamic based group. However, that does not mean that all Muslims are terrorists. This sense of prejudice towards those who are Muslim can be seen in America where Donald Trump tried to pass a law which restricted individuals that came from Islamic countries to enter the U.S.A and in Germany where recently the finance minister stated that Mosques needed to be monitored and kept transparent. When all this is happening, it may mean that those who are Muslim may not feel accepted and therefore may fear their safety and standing within the world community. This should not be the case, action should be taken to stop terrorists, but there should not be prejudice towards innocent people purely based on what religion they belong to.

Finally, all humans should have the right to the freedom of movement. If they feel as if their life is threatened, then they should be able to move to another country and seek refuge. However, due to the increasing amounts of laws that are restricting this from happening people are forced to live in harsh conditions for an extended period of time, even though they were trying to move to another country and save their lives. These restrictions should be removed, we should be more accepting and work towards helping those people find new homes where they can finally have a peace of mind and live a normal life like you and I do.

I believe that everyone under the sun is equal and that we should be able to live the life that we wish. We need to be more open minded towards different religions and cultures, we should work to remove any existing racist sentiments and be more accepting towards all humans.

**45 පිටෙන්**

ගැනීමටත් ඒ ඒ අහිංසක සොරකම් ටික සිදුකරන්නටද ඔවුන් විසින් තෝරාගත් ස්ථාන වෙනුවෙන් ජාති-ආගම් බේදයක් නැති බව පැහැදිලිව පෙනේ. ඒ නිසාම මඤ්ඤොක්කා ටික සිංහල බණ්ඩෙග කොටුවෙන් ඉගිල්ලෙද්දී කටගැස්මට අවශ්‍ය කුකුල් මස්ටික වෙනුවෙන් කුකුල් නාම්බෙක් සොරා ගැනෙන්නේ මුස්ලිම් පාරුක්ගේ කුකුල් කොටුවෙනි. ඒ කුකුලත් සිංහලද මුස්ලිම්ද කියා ඔවුනට ගාණක් නැත. ඒ වෙනුවෙන් ඉදිරිපත් වන්නේ සිංහල චුට්ටාය. පාරුක්ට අහුවුණා නම් චුට්ටෙ සුන්නත් වන්නටත් ඉඩ තිබුණා යැයි කීම අතිශය කොලුකාර වන අතර එවැනි අවදානම් සහගත දේ වෙනුවෙන් ඉදිරිපත් වීමට පවා මේ මිතුරු ශක්තිය බලවත් වී තිබීම වටින බව අප තේරුම් ගත යුතු නොවේද? මේ රහස් බෙල්ල ගියත් රැකෙන රහස් බවට මේ මිතුරු ඇසුර ජාති-ආගම් භේදයෙන් තොරව අපට ප්‍රතිඥා දේ. හොරාට උස්සන් ආ කුකුල් නාම්බා පවා ඉතාමත් ආගමානුකූලව හැමෝටම සරිලන අයුරින් හලාල් කොට චිකන් කරියක් හදන්නේ මුස්ලිම් හම්සාන්ය. ඉතින් මේ මිතුරන් සතර දෙනා එනම් සෆරීන්-චුට්ටෙ-හම්සාන් හා අපේ කථකයා අතේ ඇඟිලි පහ වගේ එකිනෙකා වෙනුවෙන් එකිනෙකට බැඳුණු අපූරු මිතුරු සහෝදරාත්මක බන්ධනයක් නොවන්නේද? හම්සාන් අතින් හලාල් ක්‍රමයට චිකන් කරිය හැදෙනවාත් සමගම අනිත් උන් ඒ වන විටත් මඤ්ඤොක්ක ටික තම්බන්නට ඇත.

සියල්ලම නිසියාකාරව සිදුවෙමින් පවතී. දැන් ඉතින් ගල් බෝතලයේ සිංහයාට කල එළි බසින්නට කාලය නොවේද? 'සිංහ ලේ' වෙනුවෙන් මරාගන්නා යුගයක සිංහයා පවා පාඩුවේ බිමට බැස විත් මේ ඉඩ හරින්නේ ඊටත් වඩා උතුම් කර්තව්‍යයකට නොවේ දැයි අපට සිතෙන ලෙස ඒ පද ඉතාමත් උත්ප්‍රාසයක් උසුලා සිටිනවා නොවේද? ගල් බෝතලයවත්, තැම්බුණු මඤ්ඤොක්කා වත්, චිකන් කරියවත් එහෙම නැත්නම් හැමෝටම එක සේ දැනෙන වෙරි මත වත් සිංහල හෝ මුස්ලිම් නොවේ නම් ඒ වටා එකා වාගේ ඉඳගෙන ඉන්නා උන්හට මොන ජාති ආගම් ප්‍රශ්නද?

එතැන් පටන් ඔවුනගේ දවසේ විඩා නිම වෙමින් ජාති-ආගම් භේදයෙන් තොරව වඩියෙන් වඩිය ගල් බෝතලය සම සමව සතර දෙනා අත බෙදී යන්නට ඇත. අවුළුපත් කටගැස්ම ඒ වෙනුවෙන් ඇවිළෙන්නට තව තවත් අත් උදව් සපයන්නට ඇත. කවියේ මේ හරියට වගේ එනකොට ඒ දිහා බලා සිටින මට වෙනමම කාලාවකාශයක් තනා දුන්නා සේය. ඇත්තටම මේ ලංකාව ඇතුළේ සිදුවෙමින් පවතින්නක් දැයි යන කුතුහලය සිතට නැඟෙන ලෙසටම අසරණ බවක් මේ වන විට දැනෙන්නට ගන්නේය. රටේ තැන නොතැන ජාතිය ආගම වෙනුවෙන් බැණ අඬගසන මරා ගන්නා වාතාවරණයක් ඇතුළත මෙහෙම දේ සිදුවන කොළණියක් ඇත්තටම තිබේ දැයි කියා සිතෙන විට සිතට සියුම් දුකක් දැනේ. මේ මිතුරු ගොන්නට ඒ කිසිදු ප්‍රශ්නයක් නැති සේය. එකා වගේ එක්වී සපයා ගත් දෑ තුළ දියවෙමින් නිවී යන ඒ චමත්කාරමය මොහොත ඔවුනගේය. එය අපට උදුරාගත නොහැක. ජාතිය හෝ ආගම සඟවමින්, එනම් සැඟවී දිය වී යන්නට ඉඩහරිමින් පුංචි කොළණියක හෝ තිප්පොළක හෝ ඒ අවට පරිසරයක, එනම් දුර ඈතක මනුස්සකමම මතුවී පෙනෙන්නට ගනී. එය අමාවක රාත්‍රියක් වුවද හඳ එළියක් වාගේ මනුස්සකමේ රන්වන් මුහුණු දිළිසෙන්නට ගන්න එවැනි හෝරාවන් පුංචි පුංචි කොළණිවලට පමණක් නොව අප සියලු දෙනාටම සියලු තැනදීම අවැසි නොවන්නේද? මෙන්න මේ ඈත දුරක ඉහළට නැඟෙන මනුස්සකම අපට පාදා මතුකරගන්න බැරිවීම නිසාම අප සියලු දෙනාම මිනිසත්කමට තරම් නොවන නොවටිනා මහා අර්බුදයක අද පැටලී සිටිනවා නොවේද?

මත්වතුර හිස් බමන මොහොතක වුව, මිතුරු සමූහයා අතරේ කාලය නිවී ගෙවී යන්නේ නොදැනීමය. උනුනට එකිනෙකා ගෙන් බෙදා වෙන්කර ගන්නට දේ නොමැත. ඔවුන්ට කතා කරන්නට බොහෝ දේ ඇත. ඒවා කුරාණය තරම් දිගය. නමුත් ඒ මොහොත ඒ මොහොත තුළම වූ සෞන්දර්යය කරණ කොට ගෙන ගෙවී යන ඉක්මන අප කවියා දකින්නේ කෙටිම කෙටි ධම්ම පද ගථාවක් කියවා නිම වුණා වාගේ ඉතාමත් ඉක්මනින් ඒ රාත්‍රියද අතීතයට එක්වෙමින් ගලා යන බවය. ජාති ආගම් ප්‍රශ්නවලින් තොරව එකා සේ වෙසෙන මේ මිනිසුන් ගැන කියන මේ කතාව සැබවින්ම ඉන්ද්‍රජාලික කතාවක් දැයි සිතෙන තරමටම අපේ ලෝකය වියවුල් වී ඇත. ඒකට ඔවුන්ට කරන්නට දෙයක් නැත. මෙය බලා ඇදහිය නොහැකි තැනටම මේ මහත් සමාජය විසින් අපගේ මනස් කවුළු පටු කර හමාරය.

දැන් ඉතින් බෝතලේ පතුළ පෑදී ඇත. හතර දෙනෙක් අතරේ බෙදී ගිය ගල් බෝතලය ඔවුන්ට අවැසි සියලුම දේ නොදුන්නා විය හැක. නමුත් වෙලාවේ හැටියට ඔවුනගේ එකමුතුවෙන් උදාකර ගත් ඒ මොහොත දැන් ඉතින් නිමාවන්නට ළඟය. යළිත් උදයේ තිප්පොළේ වැඩට යා යුතුය; තවත් දවසක් වෙනුවෙනි. මේ නම් ජීවිත ප්‍රශ්න පත්තරයට මුළුමනින්ම උත්තර සොයාගත්තා වූ මොහොතක් නොව, ඒ වෙතින් පළා යාමට එනම් ඒ ප්‍රශ්න අමතක කිරීමට සිව්වනක් මිතුරන් විසින් උදා කරගත් එක්තරා අහිංසක මොහොතකි. දැන් එකිනෙකා එකම තැනකින් එකිනෙකා වෙත සමුදී යා යුතුය; යළිත් හෙට උදයේ මුණගැසෙනු රිසියෙනි.

ඔවුනොවුන් එකිනෙකා බදා වැළඳ හැපිහැපී වැනිවැනී එකම මංසලකට විත් සමුගන්න සැරසේ. නමුත් ඒ මනුෂ්‍යත්වයේ අහිංසක සමුගැනීමක් විනා අප අත්දකින මනුෂ්‍යත්වයෙන් පළා යාමක් බඳු දෙයක් නොවේ. එකිනෙකා වත්තම් කරගෙන හන්දියට එනම් මංසලට ගාල් වෙන ඔවූහු එලෙස වෙන් වෙති. නමුත් ඉතා ඈත තිප්පොළක් ඇසුරේ කොළනියක සිදුවන මේ පුංචි සිදුවීම ඊයම් බරු බැස්සා වාගේ අපේ හිත්වලට බහින්නේ අප අතරින් ගිලිහී ගිය මේ මිනිසත්කමේ අඩුව නිසා අද දවසේ අප සියලු දෙනාම විඳවන විඳවිල්ල දැකීමෙනි;

මුසල්මානුවෝ රහ මෙර නොබොති; ඒ ආගමික සංදර්භයක් යටතේය. එනමුදු එකාවන්ව ක්‍රය ශක්තිය වෙහෙසමින් එකම තිප්පොළක ජීවිත ගැට ගහගනු වස් දෛනික රැකී රාක්ෂාවන්හි නිරත වන මේ සිහල-මුස්ලිම් සිව් මිතුරු කැළ, මිත්‍රත්වයේ හා සහෝදරත්වයේ නාමයෙන් එකම මත්වතුර බෝතලයක් පාමුල හෘදයාංගම මත් බවක ගිලී යන්නේ ආගම වැනි කාරණාවකින් මෙල්ල කරලනු බැරිවුණ ඒ අප්‍රමණා මානවීය බන්ධුතාවය විදා දක්වමිනි. මිනිසුන් අතර බැඳීම් වැඩිකිරීමටම බිහිවුණු ආගම්ම, එකිනෙකා අතර ආදරය රඳා පවත්වා ගන්නට ඉඩ හසර නොතබා වෛරීය සිතුවිලිවලින් එකිනෙකා බෙදා වෙන් කරන්නට පොළඹවන මොහොතක, ජාතිය-ආගම වැනි දේ, ඒ අර්ථයෙන් නොවටිනා දෑ ලෙස ගෙන දියවයන්නට ඉඩහැර මනුෂ්‍යත්වයම ඔසවා තැබීම වෙනුවෙන් පුංචි උදාහරණයක් සපයන මේ කව, ඈත කොළනියක සිදුවන පුංචි සිද්ධියක් අබිමුව පවා මිනිසුන් ලෙස තාමත් අප කොතරම් කුඩා දැයි වටහා ගන්නට ඉඩ සලසන අයුරු කොතරම් අපූරුද? සංවේදී මෙන්ම සංවේගජනකද?